# සීයයි මුනුබුරයි



- සීයාහ්.. මල්ලියාගෙ කකුලුත් අපේ අත් වගේ නේහ්......!
- පුතා කියන්නෙ ඇඟිලි පහක් තියෙන එක වෙන්ටෑ.....?
- නෑ සීයෙ..... අද්දෙකේ වගේම කකුල් දෙකෙත් රේකා පිරී.....ඊ.....ලා
- ංආ..... රේකා හින්දා් ද? ලොකු වෙන කොට ඇවිදිනකොට ඒවා් මැකෙනවා්.
- වඳුරොංගෙ අත් වලත් රේකා තියෙනවා ලු නේහ්.....?
- ඔව්..... හරියට අපේ වගේ මය් ඒවාත්...
- උංගෙ අත් බලලා සාස්තර කියන අයත් ඉන්නව ද සීයෙ.....?
- මං නං අහලා් නෑ..... ඒත්.....
- ඇය් සීයෙ ඉන්දියාවෙ ඉරිසීන්නාන්සෙල දන්නව ඇති නේ.....!

වික

## බඹර කවි
### හෙවත් මලි ගී

බැද්ද වටට සුදු මොර මල් පිපීලා
සද්ද කර බඹරු ඒ වග අසාලා
ඉටිත් පැණිත් ලොව හැමටම බෙදාලා
යන්නම් බඹරු දුක් මැසිවිලි කියාලා

සැම දෙවියන්ට සැල කරලා කියඤ්ඤඤයි
සැම දෙවිඳුන් ගෙන් විවරණ ලබඤ්ඤඤයි
සැම දෙවිඳුන් ගෙන් ඉටි පැණි ලබඤ්ඤඤයි
සැම දෙවියනේ අද මා බිම බසිඤ්ඤඤයි

ලියා එවීවේ
**වි ක ධර්මබන්ධු**




අනුරාධපුරයටත් එහා ගලෙන්බිඳුනවැව ගමෙන් ආ සේනානායක වේරලියද්ද නම් වූ අපූරු ගායකයා එක ගීයකින් රසික හදවත් වල සදා නොමැකනෙ සේ සිය නම සනිටුහන් කළේ ය.
සිය පියාගේ සරසවි කලායතනයෙන් සංගීතය පිළිබඳ මුලකුර කියූ සේනානායක මුල් වතාවට ගීයක් ගායනා කළේ රජරට සේවයේ රජරට කැකුළු වැඩ සටහනටය. එදා සිට ඔහු ආ වේගවත් ගමන මගේ නොමැකෙන සටහන් රැසකි. මල් වියනෙන් වැනි, කුස පබාවතී, කොහේ කොතැනක, කන්ද පිරිමැද වැනි ගී රැසක් ගායනා කළ සේනානායක සිය ප්‍රථම මෙල්බන් සංචාරයේ දීම ප්‍රසාංගික ගායන ශිල්පියෙකු ලෙස රසික හදවත් දිනා ගත්තේ ය. එදා ඔහු රසික හදවත් පිනවූ සුන්දර විලාසය අදත් අපට මතකය.

නූතන හෙළ ගී කෙතේ කෝකිලාවියක වන් නිරෝෂා විරාජිනි ය මෙල්බන් නුවරට ආගන්තුක ගායිකාවක නොවන්නී ය. සදා මතකයේ රැඳෙන පුන් සඳ රෑට, කරදිය සුළඟට, සඳ දිය උතුරා වැනි අපූරු ගීත රැසක් අපට දායාද කළ නිරෝෂා, සිය මධුර හඬින් රසික හදවත් නිබඳ පිනවූවා ය.

සේනානයක වේරලියද් ගායකයාත් නිරෝෂා විරාජිනී ගායිකාවත් මෙවර මෙල්බන් පුරවරයට එන්නේ ජනවාරි 15 වන දා සවස 2ට සහ 6ග30 ට බර්වුඩ් හි බීසන් සෙන්ටර් හිදී පැවැත්වෙන ගිම්හානයේ ගී ප්‍රසංගය සඳහාය. කවදත් වැදගත් සේවාවක නිරතව සිටින ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය මේ ප්‍රසංගය සංවිධානය කරයි. එදිනට බීසන් රංග ශාලාවට ගිඩෙ වුනොත් ඔබටත් සදා මතකයේ රැඳෙන ප්‍රසංගයක් රස විඳින්නට හැකි වනු ඇත.


**Raigam**

2006

සුබ නව වසරක් වේවා!

**Wish you a Very Happy & Prosperous New Year !**

මේ සුබ පැතුම්

**THE KINGDOM OF RAIGAM®**

21 වන සියවසේ දේශීය සමාගම

**www.raigam.lk**

**Sri Lanka**

**&**

**E-Techno Enterprises Australia**

රයිගම් නම් කවදත් කොතැනත් හරිම රසයි!

Wholesale & Customer Service 03-9700 2100 & 03-93703813 Fax: 03-9337 9468

Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, PO Box 87, VIC 3039
Email:sales@etechno.com.au



**Professional Tutoring/Coaching**

Focus on both Individual and Groups sessions

**Subjects Offered**

- Specialist Mathematics
- Mathematical Methods
- Further Mathematics
- Mathematics For IB curriculum
- Mathematics (Years 5-10)
- Physics (VCE/ IB)
- Chemistry (VCE/ IB)
- Biology Accounting IT

**Our Specialties**

- Excellent coaching for both VCE and IB curriculum
- Finishing the VCE/IB curriculum as early as possible
- More and more Trial Exams/ Past exams papers, aiming towards a proper examination preparation
- White board teaching when essential

**Conducted by**

Athil Goonesekera
ATA Professional Solutions
17A Dunstan Street Macleod Tel: 94569714
Mobile: 0433113836
Email: athil_g@bigpond.net.au

ශ්‍රී ලාංකික ප්‍රජාවගෙන් අයකෙරෙන මුදලින් 5% ප්‍රමාණයක් අප මව් රටේ දක්ෂතා ඇති දුප්පත් ළමුන්ගේ මාසික අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා බැර කරනු ලැබේ.



**සන්නස**

අන්තර්ජාලයෙන් ලොව වටා

www.sannasa.net

දැන් **Sinhalajukebox.com** අනුග්‍රහයෙන්

**සන්නස පසුගිය කලාප ද අන්තර්ජාලයෙන් කියවන්න**



නැවුම් පුවත් හාරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය

ලක් හඬ FM 97

**සෑම ඉරිදාවකම**

දහවල් 10.00 සිට 12.00 දක්වා

ඔබේ හඬ - ලක් හඬ